# භූගෝල විද්‍යාව

## 5.1.2 ශ්‍රී ලංකාවේ නාගරිකරණ ක්‍රියාවලිය



## 5.1.2 ශ්‍රී ලංකාවේ නාගරීකරණ ක්‍රියාවලිය.

ශ්‍රී ලංකාවේ නාගරීකරණ ක්‍රියාවලිය කෙරහි අවධානය යොමුකරන විට ඒ සඳහා ප්‍රධාන වශයෙන් ක්‍රම තුනක් බලපා ඇති බව පැහැදිලි වේ.

- ග්‍රාමීය නාගරීකරණ සංක්‍රමණය.
- නාගරික ප්‍රදේශවල ස්වාභාවික වර්ධනය.
- ග්‍රාමීය ප්‍රදේශ නාගරික පරිපාලන සීමා තුළට ඇතුළු කිරීම.

## ග්‍රාමීය නාගරීකරණ සංක්‍රමණ

දියුණු වෙමින් පවතින ලොව අනෙක් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ නාගරීකරණ මට්ටම ප්‍රමාණාත්මක ව  අඩු මට්ටමක පවතී.නමුත් පසුගිය දශක කීපය තුළ ශ්‍රී ලංකාවේ නාගරීකරණයේ ශීඝ්‍ර වර්ධනයක් ඇති වූ බව ප්‍රකාශ කරණු ලබයි. විශේෂයෙන් වැඩි පහසුකම්වලින් යුක්ත ප්‍රදේශවලට ජනයා සංක්‍රමණය වීම දැකිය හැකි ය. යටිතල පහසුකම්වල වර්ධනය එනම් විදුලිය, ගමනාගමනය, සන්නිවේදනය, සෞඛය, හා අධ්‍යාපන, ක්ෂේත්‍රවල වර්ධනය මෙන්ම කර්මාන්ත හා වෙළදාම් ක්ෂේත්‍රයේ ද වර්ධනය නාගරීකරණය කෙරෙහි බලපා ඇත.

## ග්‍රාමීය නාගරීකරණ සංක්‍රමණවලට බලපාන සුවිශේෂී හේතු කීපයක් අපට හඳුනාගත හැකි ය.

- ග්‍රාමීය ප්‍රදේශවල රැකියා හිගවීම හේතුවෙන් රැකියා සොයා නගරවලට සංක්‍රමණය වීම.
- කර්මාන්ත ශාලා හා අනෙකුත් ව්‍යාපාර නගරයේ සංකේන්ද්‍රණය වී තිබීම නිසා ග්‍රාමීය අතිරික්ත ශ්‍රම බලකාය නගරයට සංක්‍රමණය වීම.
- උසස් අධ්‍යාපනය සඳහා නගරයට සංක්‍රමණය වීම.
- දියුණු සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා.
- ග්‍රාමීය ප්‍රදේශ වල යටිතල පහසුකම් දුර්වල විම නිසා නගරයට සංක්‍රමණය වීම .
- වඩාත් සැපවත් ජීවිත ගත කිරීමේ බලාපොරොත්තුව.
- නගරවල ජීවත් වන ඥාති හිත මිත්‍රාදීන් සමග එක්  වීමට.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නාගරික ප්‍රදේශවල ස්වභාවික වර්ධනය

2012 ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ නාගරික ජන සංඛ්‍යා ප්‍රතිශතය 18.3% කි. සමස්තයක් ලෙස ගත් විට නාගරික ප්‍රදේශවල ස්වාභාවික වර්ධනය සාමාන්‍ය මට්ටමක පවතී.

## ග්‍රාමීය ප්‍රදේශ නාගරික පරිපාලන සීමා තුළට ඇතුළු කිරීම

ශ්‍රී ලංකාවේ නගර ලෙස අර්ථ දක්වන්නේ මහ නගර සභා සහ නගර සභා මගින් පාලනය වන ප්‍රදේශයන් ය. නාගරික පරිපාලන කාර්යන් තිබීම ශ්‍රී ලංකාවේ නගර හඳුනා ගැනීමේ දී මූලික නිර්ණායකය ලෙස පිළිගනී. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ ලෙස හඳුනාගන්නා ස්ථාන කාලයෙන් කාලයට වෙනස් වේ. ඊට හේතුව රජය මගින් පරිපාලන සීමාවන් විවිධ අවස්ථාවලදී වෙනස් කිරීමයි. 1987 වන තුරුම මහ නගර සභා, නගර සභා හා සුළු නගර සභා ප්‍රදේශ නාගරික ප්‍රදේශ ලෙස හඳුනා ගන්නා ලදි නමුත් 1987 න් පසු සුළු නගර සභා නාගරික තත්ත්වයෙන් ඉවත් කරන ලදි. මේ නිසා බොහෝ විට අඩු ජන සංඛ්‍යාවක් ඇති සමහර ප්‍රදේශ ග්‍රාමීය ප්‍රදේශ ලෙස හඳුනා ගැනීම සිදුවිය.

මේ ආකාරයට ශ්‍රී ලංකා රජය මගින් විටින් විට පරිපාලනමය අවශ්‍යතා මත නාගරික සීමාවන් වෙනස් කිරීම හේතු කොට ශ්‍රී ලංකාවේ නාගරීකරණ ක්‍රියාවලිය වෙනස් විය.

2012 වන විට ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ සංඛ්‍යාව 64 ක් විය. ඉන් නාගරික ප්‍රදේශ 26 ක් ම ඉතා කුඩා නගර වේ.

**ලෝකයේ අනෙක් දියුණු වෙමින් පවතින රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අඩු නාගරික මට්ටමක් පවතී. ඊට බලපාන සාධක කිහිපයක් හඳුනා ගත හැකි ය.**

- ගම හා නගරය අතර විෂමතාවය අඩු වීම.
- ප්‍රාථමික ප්‍රදේශවලටද සම්පත් යොමු වීම.
- ප්‍රවාහන හා සංනිවේදන පහසුකම් දියුණු වීම.
- ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයකට දිනකින් ළඟා වීම හැකි වීම.
- යුද්මය තත්ත්වය නිසා උතුර නැගෙනහිර ප්‍රදේශවල නාගරීකරණය දුර්වල වීම.
- නාගරික ප්‍රදේශ, ප්‍රාදේශීය සභා ප්‍රදේශවලට ඇතුළත් කිරීම.
- ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීම හා කාර්මික කටයුතු ව්‍යාප්තිය.

### 2016 දී ශ්‍රී ලංකාවේ නගර සභා සංඛ්‍යාව

| වර්ගය | ගණන |
|---|---|
| නගර සභා | 41 |
| මහ නගර සභා | 23 |

Copyright www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එච්.පී.ඉන්ද්‍රා කුමාරි , ගුරු උපදේශිකා - දෙනුවර අධ්‍යාපන කලාපය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
පරීක්ෂා කිරීම- මල්ලිකා සෙනෙවිරත්න- ගුරු උපදේශක-ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ශ්‍රී ලංකාවේ නාගරීකරණයේ අනාගතය.

- උතුරු නැගෙනහිර යුධමය වාතාවරණය තවදුරටත් නොපැවතීම නිසා අනාගතයේදී එමගින් ඇති කරන සෘණාත්මක බලපෑම අඩුවීම අනාගත නාගරික ජන සංඛ්‍යාව වැඩි වීමට හේතු වේ.

- අනාගතයේ නව නාගරික සැලසුම් ( බස්නාහිර පළාත් මහා නාගරික සැලැස්ම) ක්‍රියාත්මක වීම තුළින් ද ශ්‍රී ලංකාවේ නාගරිකරණය ඉහළ යනු ඇත.



Copyright www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එච්.ජී.ඉන්ද්‍රා කුමාරි , ගුරු උපදේශිකා - දෙනුවර අධ්‍යාපන කලාපය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
පරීක්ෂා කිරීම- මල්ලිකා සෙනෙවිරත්න- ගුරු උපදේශක-ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පැවරුම්

(1) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනයා නාගරික ප්‍රදේශ වලට සංක්‍රමණය වීමට බලපාන සාධක මොනවාද?
(2) ලෝකයේ වෙනත් දියුණු වෙමින් පවතින රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අඩු නාගරීකරණ මට්ටමින් පැවතීමට බලපාන සාධක 05ක් ලියන්න.

## පිළිතුරු

(1)

- දියුණු සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම.
- යටිතල පහසුකම් නාගරික ප්‍රදේශ වල වර්ධනය වී තිබීම.
- නාගරික ප්‍රදේශ වල ග්‍රාමීය ප්‍රදේශ වලට වඩා අධ්‍යාපන පහසුකම් වර්ධනය වී තිබීම.
- රැකියා ඉඩ ප්‍රස්ථා ලබා ගැනීම.
- නාගරික ප්‍රදේශ වල කර්මාන්ත හා වෙළඳාම වර්ධනය වී පැවතීම.

(2)

- ගම හා නගරය අතර විෂමතාවය අඩු වීම.
- ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයකට එක් දිනයකින් ලගා විය හැකි වීම.
- ප්‍රාදේශීය සංවර්ධනය හොඳ මට්ටමක පැවතීම.
- ප්‍රවාහන දියුණුව.
- සන්නිවේදන දියුණුව.





අන්තර්ගතය :- එච්.ජී.ඉන්ද්‍රා කුමාරි , ගුරු උපදේශිකා - දෙනුවර අධ්‍යාපන කලාපය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගී මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
පරීක්ෂා කිරීම- මල්ලිකා සෙනෙවිරත්න- ගුරු උපදේශක-ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
Copyright © www.e-thaksalawa.moe.gov.lk
www.e-thaksalawa.moe.gov.lk